[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම - 2023

| | | | |
|---|---|---|---|
| 06 ශ්‍රේණිය | විෂයය - පුරවැසි අධ්‍යාපනය | පත්‍රය I/II | පැය - 02 යි. |

නම ........................................

I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට ගැලපෙන පිළිතුර තෝරා ඉරක් අඳින්න.**

01). නිවස හැරුණු විට ඔබට වඩාත් හුරු පුරුදු පරිසරය වන්නේ,
1). පන්සලයි 2). ආරෝග්‍ය ශාලාවයි
3). ඔබේ පාසලයි 4). පුස්තකාලයයි.

02). ශ්‍රී ලංකාවේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය,
1). පළාතයි 2). දිස්ත්‍රික්කයයි
3). ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි 4). ග්‍රාම නිලධාරි කොට්ඨාසයයි

03). බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන,
1). දෙකකි 2). තුනකි 3). හතරකි 4). පහකි

04). පහත සඳහන් කරුණු අතුරින් පාසලෙන් සමාජයට සැපයෙන සේවාවක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1). පාසල සතු දේපළ ආරක්ෂා කිරීම.
2). පාසලේ සංවර්ධන කටයුතු සඳහා සහාය වීම.
3). යහපත් පුරවැසියන් බිහි කිරීම.
4). පාසලේ විවිධ උත්සව කටයුතු සඳහා සහභාගි වීම.

05). තම දුර්වලතා අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයකි.
1). තම දුර්වලතා හඳුනා ගැනීම
2). අනුන්ගේ දුර්වලතා පෙන්වා දීම
3). අනුන්ගේ දුර්වලතා හඳුනා ගැනීම
4). තම දුර්වලතා පිළි නොගැනීම

**අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් ✗ ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06). සෑම දරුවකුම සුවිශේෂි දරුවෙකි. (   )

07). ඖෂධවේදය පිළිබඳ මෙරට ප්‍රථම මහාචාර්යවරයා
වූයේ නන්දදාස කෝදාගොඩ මහතා ය. (   )

08). ජීවිතයට සැලසුමක් අත්‍යවශ්‍ය නොවේ. (   )

09). නීති ගරුක වීම ඔබේ ගෞරවය ආරක්ෂා වීමට හේතු වේ. (   )

10). මානව සම්පත විධිමත්ව පුහුණු කිරීමෙන් ආර්ථික වාසි සැලසේ. (   )

**( ලකුණු 2 ✗ 10 = 20)**

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11). පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ ..................... තුළින් ප්‍රකාශ වේ.

12). යහපත් ............................ නිසා පාසල සමාජයට විවෘත වේ.

13). මිනිසා තම කායික හැකියා හා ............................... හැකියා වර්ධනය කර ගැනීම නිසා මානව සම්පතක් බවට පත්වේ.

14). භෞතික සම්පත් මඟින් මිනිසාට ලැබෙන මෙහෙය අතිමහත්ය. එනිසා ඒවා .............................. කළ යුතුය.

15). සෑම පුද්ගලයකුටම ජීවිත ................................ වලට මුහුණ දීමට සිදුවේ.

( මානසික, අභියෝග, ආවේණික, ප්‍රජා සබඳතා, දැක්ම, සංරක්ෂණය) **(ලකුණු 2 ✗ 5 = 10)**

**අංක 16 සිට 20 දක්වා A කොටසේ ඇති ප්‍රකාශයට ගැළපෙන ප්‍රකාශය B කොටසින් තෝරා යා කරන්න.**

| A | B |
|---|---|
| 16). ඔබේ පාසල ඉටු කරන මෙහෙය දැක්වේ. | A. වැටි බැඳීම |
| 17). පාසලේ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් හා පිළිගැනීම් | B. අයිතිවාසිකම් |
| 18). පාංශු රක්ෂණ ක්‍රමයකි. | C. සම්ප්‍රදායයන් වේ |
| 19). සම්පත් නැවත භාවිතා කිරීම | D. මෙහෙවර ප්‍රකාශය |
| 20). යුතුකම් ඉටු කිරීම තුළින් තහවුරු වේ. | E. ප්‍රතිචක්‍රීකරණය |

**(ලකුණු 2 ✗ 5 = 10)**

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්යය වේ.**
- **තවත් ප්‍රශ්න 4ක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.**

01).

I). ඔබේ පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

II). ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක ඇතුළත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

III). පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබ සතු විය යුතු හොඳ ලක්ෂණ දෙකක් දක්වන්න.

IV). දකුණු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් සඳහන් කරන්න.

V). සැලසුම්කරණය හා සංවිධානය නිසා අත්වන වාසි දෙකක් ලියන්න.

VI). ඔබ ප්‍රදේශයේ ඇති ආගමික සිද්ධස්ථාන දෙකක් නම් කරන්න.

VII). ආගමික සිද්ධස්ථානයකින් ඉටුවන සේවාවන් දෙකක් ලියන්න.

VIII). ඔබට හිමිවිය යුතු අයිතිවාසිකම් දෙකක් ලියන්න.

**(ලකුණු 2 × 8 = 16)**

02).

I). පාසලේ අනන්‍යතාව පෙන්නුම් කරන සංකේත දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). ඔබේ හැකියා වර්ධනය සඳහා රජය විසින් ඔබට සපයනු ලබන පහසුකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

III). පාසල් සිසුවකු වශයෙන් ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

03).

I). පාසල් සංවර්ධන කමිටුවේ නිලධාරීන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

II). පාසලක දියුණුව සඳහා සමාජයේ දායකත්වය ලබා ගත හැකි කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III). ළමා මිතුරු පාසල් පරිසරයක හඳුනාගත හැකි ලක්ෂණ පහක් ලියා දක්වන්න. (ලකුණු 05)

04).

I). අන් අය සමඟ ගනුදෙනු කිරීමේදී ගොඩනඟා ගත යුතු ආචාර ධර්ම දෙකක් ලියන්න. (ලකුණු 02)

II). පුද්ගලයකු සතු හැකියා දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා යොදාගත හැකි ක්‍රමවේද 2ක් නම් කරන්න. (ලකුණු 04)

III). A.නිදහස් අධ්‍යාපනයේ පියා යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන්ද?

B.එතුමා ගැන වාක්‍ය තුනක් ලියන්න. (ලකුණු 05)

05).

I). පරිපාලන බෙදීම අනුව ශ්‍රී ලංකාව බෙදා ඇති පළාත් ගණන කීයද? (ලකුණු 02)

II). ඔබ ජීවත්වන දිස්ත්‍රික්කය හා එය අයත් පළාත නම් කරන්න. (ලකුණු 04)

III). A.ඔබ ප්‍රදේශයේ පවත්නා භෞතික සම්පත් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

B.මිනිසාගේ පැවැත්මට අත්‍යාවශ්‍ය වන සම්පත් තුනක් නම් කරන්න.

(ලකුණු 05)

06).

I). අපට සහාය වන පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න. (ලකුණු 02)

II). පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 04)

III). පහත සේවාවන් ලබා ගත හැකි ආයතන හෝ පුද්ගලයන් ඉදිරියෙන් ලියා දක්වන්න.

1). උප්පැන්න සහතික නිකුත් කිරීම -

2). විදුලි පණිවිඩ බෙදීම -

3). නගර පිරිසිදු කිරීම -

4). සැත්කම් සිදු කිරීම -

5). ග්‍රාම සේවා සහතිකයක් ලබා ගැනීම -

(ලකුණු 05)

07).

I). ඔබ ප්‍රදේශයේ මිනිසුන් සාමූහිකව කටයුතු කරන අවස්ථා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II). සාමූහිකව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III). A. ඔබ ප්‍රදේශයේ ජනතාව එකතුවී පිහිටුවා ගෙන ඇති සමිතියක් නම් කරන්න.

B. ඉන් ඉටුකරනු ලබන සේවාවන් තුනක් ලියා දක්වන්න. (ලකුණු 05)

**පුරවැසි අධ්‍යාපනය 06 ශ්‍රේණිය**

**පිළිතුරු පත්‍රය**

**I කොටස**

01). 3 02). 4 03). 2 04). 3 05). 1

06). ✓ 07). ✗ 08). ✗ 09). ✓ 10). ✓

11). දැක්ම 12). ප්‍රජා සබඳතා 13). මානසික 14). සංරක්ෂණය 15). අභියෝග

16). මෙහෙවර ප්‍රකාශය 17). සම්ප්‍රදායයන් 18). වැටි බැඳීම 19). ප්‍රතිචක්‍රීකරණය

20). අයිතිවාසිකම්


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න